INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

25th YEARS OF PRUDENT REGULATION 2001 - 2026

# ශක්තිමත් හෙට දවසක් සඳහා සුරක්ෂිත රටක් ගොඩනැගීම

**ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය පරිවර්තනයේ නව යුගයකට පිවිසෙයි**

**රක්ෂණ කර්මාන්තය සඳහා නව පරිච්ඡේදයක් ආරම්භ වේ.**

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL), ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය (IASL) සහ කර්මාන්තයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග එක්ව, ජාතික මුලපිරීම් මාලාවක් සහ ශ්‍රී ලංකාවේ රක්ෂණ දැක්ම 2030 සහ 2035 දියත් කිරීම ආඩම්බරයෙන් නිවේදනය කරයි. එය රට පුරා මූල්‍ය සුරක්ෂිතතාවය, ඔරොත්තු දීමේ හැකියාව සහ විශ්වාසනීයත්වය ශක්තිමත් කිරීම සඳහා නිර්මාණය වූ පැහැදිලි මාර්ග දැක්මකි.**

## දියත් කරන ප්‍රධාන ජාතික මුලපිරීම්

- රක්ෂණ කර්මාන්ත සංවර්ධන මාර්ග දැක්ම (දැක්ම 2030 සහ 2035)
- මධ්‍යගත රක්ෂණ දත්ත ගබඩාව (ණය තොරතුරු කාර්යාංශය සමග ඒකාබද්ධ කිරීම)
- ඩිජිටල් මෝටර් රක්ෂණ කාඩ්පත සහ ජාතික මෝටර් රථ රක්ෂණ සත්‍යාපන පද්ධතිය
- අනු නීති සංයුක්ත කරන ලද ප්‍රධාන චක්‍රලේඛය සහ වාරික ගෙවීම් වගකීම (PPW)
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ විද්‍යුත් පුවත් පත්‍රිකාව

## රක්ෂණ කර්මාන්තය පරිවර්තනය කිරීම

**මෙම මුලපිරීම් මගින් මෙහෙයවනු ලබන්නේ:**

- දැරිය හැකි සහ විශ්වාසනීය රක්ෂණයක් සඳහා වැඩි ප්‍රවේශයක්
- ශක්තිමත් පාරිභෝගික ආරක්ෂාව සහ විනිවිදභාවය
- ඩිජිටල් නවෝත්පාදනය සහ දත්ත මත පදනම් වූ තීරණ ගැනීම
- නවීන, ඔරොත්තු දෙන සහ අන්තර්ග්‍රාහී රක්ෂණ ක්ෂේත්‍රයක්

## ශ්‍රී ලංකාවේ රක්ෂණ දැක්ම 2030 සහ 2035

**ශක්තිමත් හෙට දවසක් සඳහා සුරක්ෂිත රටක් ගොඩනැගීම**

2035 වසර වන විට, ශ්‍රී ලංකාවේ රක්ෂණ ආවරණය සැලකිය යුතු ලෙස සියලුම සමාජ ස්ථර වෙත ළඟා වන පරිදි පුළුල් කිරීමට අපේක්ෂා කරයි. 2035 වසර වන විට, කුටුම්භ සවිබල ගැන්වීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කිරීම සහ ව්‍යාපාරවලට විශ්වාසයෙන් වර්ධනය වීමට හැකියාව ලබාදීම මඟින් ශ්‍රී ලංකාව සමාජයේ සියලුම කොටස් හරහා රක්ෂණාවරණය සැලකිය යුතු ලෙස පුළුල් කිරීම අරමුණු කරයි.

**මෙම පරිවර්තනය කුළුනු හතකින් යුතු උපායමාර්ගික සැලැස්මක් මගින් මෙහෙයවනු ලැබේ:**

1. ආවරණය සහ නිෂ්පාදන නවෝත්පාදනය
2. බෙදා හැරීම සහ ඩිජිටල් ඇතුළත් කිරීම
3. බදු සහ නියාමන පැහැදිලිතාවය
4. ප්‍රාග්ධනය, නුබුන්වත්භාවය සහ ආයෝජනය
5. දත්ත, හැසිරීම සහ පාරිභෝගික විශ්වාසය
6. කුසලතා, සේවා නියුක්තිය සහ මූල්‍ය සාක්ෂරතාවය
7. ක්‍රියාත්මක කිරීම, පාලනය සහ තිරසාරභාවය

**අපගේ සාමූහික කැපවීම**

ජීවිත සුරක්ෂිත කිරීම.
ව්‍යාපාර ශක්තිමත් කිරීම.
රට ඉදිරියට ගෙන යාම.

## ජාතිය සවිබල ගැන්වීම

**මෙම සාමූහික ප්‍රයත්නයන් තුළින් රක්ෂණ කර්මාන්තය වඩාත් ඔරොත්තු දෙන ආර්ථිකයක් සඳහා අඩිතාලම දමමින් සිටියි. එම ආර්ථිකය තුළ ජන ජීවිත සුරක්ෂිත කිරීම, ව්‍යාපාර සඳහා සහාය ලබා දීම සහ දිනෙන් දින අවිනිශ්චිත හා දේශගුණික විපර්යාසවලට ලක්වන ලෝකයට මුහුණ දීම සඳහා ප්‍රජාවන් වඩාත් හොඳින් සූදානම් කිරීම සිදු වේ.**

## අපි එක්ව, ශ්‍රී ලංකාවේ අනාගතය සුරක්ෂිත කරමු.



### සභාපතිතුමාගේ පණිවිඩය

**විසිපස් වසරක විශ්වාසය සහ ඔරොත්තු දීමේ හැකියාව**

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 25 වැනි සංවත්සරය සමරන මෙම අවස්ථාවේදී රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීමට සහ රටේ මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමට අප පැමිණි ගමන් මග පිළිබඳව මම බෙහෙවින් ආඩම්බර වෙමි. වසර 2001 මාර්තු මස පළමු වන දින ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ආරම්භයේ සිට රක්ෂණය මගින් සෑම පුරවැසියෙකුටම විශ්වාසදායී, විනිවිදභාවයෙන් යුතු සහ පහසුවෙන් ලබාගත හැකි ආරක්ෂිත ජාලයක් සපයන බව සහතික කිරීම සඳහා අඛණ්ඩව කැපවී සිටී.

පසුගිය වසර 25 පුරා, දැඩි ආර්ථික අස්ථාවරත්වයන්, වේගවත් තාක්ෂණික වෙනස්කම් සහ මීට පෙර අත්නොවිඳි ගෝලීය අභියෝග මධ්‍යයේ වුවද, කොමිෂන් සභාව මෙම ක්ෂේත්‍රය සාර්ථකව මෙහෙයවා ඇත. විනිවිදභාවයෙන් යුත් මූල්‍ය සංස්කෘතියක් ගොඩනැගීමට දිරිමත් කරන ආයතනයක් ලෙස ක්‍රියා කරමින් ශක්තිමත් සහ අන්තර්ග්‍රාහී පද්ධතියක් නිර්මාණය කිරීමට අපි සමත්ව සිටිමු. "සුරක්ෂිත අනාගතයක් සඳහා සැමට රක්ෂණයක්" යන්න අපගේ පැහැදිලි අනාගත දැක්මයි. මේ සඳහා අප ජාතික රක්ෂණ සංවර්ධන සැලැස්මක් එළිදැක්වීමට සැලසුම් කර ඇති අතර එමගින් පූර්ණ ඩිජිටල් පරිවර්තනයක් කරා යොමු වීම අපගේ නව උපායමාර්ගික ප්‍රමුඛතාවයයි. අපගේ ඉලක්කය වන්නේ InsurTech ඒකාබද්ධ කිරීම සහ ඩිජිටල් සබඳතා සරල කිරීම මගින් ඉහළ මූල්‍ය සුරක්ෂිතභාවයක් ලබාදීමයි. මීට අමතරව, නැගී එන දේශගුණික අභියෝගයන්ට මුහුණ දීම සඳහා අපගේ ආර්ථිකය සහ පරිසරය සුරක්ෂිත කෙරෙන තිරසාර රක්ෂණ භාවිතයන් දියුණු කිරීමට ද අපි කැපවී සිටිමු.

මුදල් අමාත්‍යාංශය වෙතත්, අපගේ වෙහෙස මහන්සි වී වැඩ කරන කාර්යමණ්ඩලය සහ නොවෙනස් වූ සහයෝගයක් ලබා දුන් සියලුම රක්ෂණ කර්මාන්ත පාර්ශ්වකරුවන් වෙතත් මාගේ අවංක ඇගයීම පුද කිරීමට මම කැමැත්තෙමි. රිදී ජුබිලිය සමරන මෙම මොහොතේ අප රටේ විශිෂ්ටත්වය, නවෝත්පාදනය සහ අඛණ්ඩ සේවය උදෙසා වන අපගේ කැපවීම අපි යළි යළිත් තහවුරු කරමු. එක්ව කටයුතු කිරීමෙන්, ඉදිරි වසර 25 තුළ සෑම ශ්‍රී ලාංකිකයෙකුටම මීටත් වඩා ආරක්ෂාවක් සහ සමෘද්ධියක් හිමිවන බව අපට තහවුරු කළ හැකිය.

ආචාර්ය ඩබ්ලිව්. ඒ. රවීන්ද්‍ර ද මෙල් -
සභාපති, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL)



### අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

**නියාමනයේ විශිෂ්ටත්වය සහ ඉදිරි ගමන් මඟ**

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ රිදී ජුබිලිය සමරන මෙම අවස්ථාවේදී අවංකභාවය, වෘත්තීයභාවය සහ රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීම සඳහා වූ අඛණ්ඩ කැපවීම පෙරදැරිව වසර 25ක් පුරා මෙරට රක්ෂණ ක්ෂේත්‍රයට මග පෙන්වීම පිළිබඳව අපි නිහතමානීව ආඩම්බර වන්නෙමු. පසුගිය විසිපස් වසරක කාලය පුරාවට රක්ෂණ ක්ෂේත්‍රය පුරා නුබුන්වත්භාවය, විනිවිදභාවය සහ සදාචාරාත්මක හැසිරීම සහතික කිරීමට කටයුතු කරන අතරම රක්ෂණ කර්මාන්තය පාරිභෝගික කේන්ද්‍රීය ප්‍රවේශයක් කරා පරිවර්තනය කිරීමේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇත.

අපගේ ප්‍රධාන ජයග්‍රහණ අතර ඵලදායී පැමිණිලි විසඳීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පිළිබඳ අවශ්‍යතා දැඩි ලෙස බලාත්මක කිරීම, රක්ෂණය පිළිබඳ මහජන දැනුවත්භාවය වර්ධනය කිරීම සහ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීම සඳහා වන අඛණ්ඩ මුලපිරීම් ප්‍රමුඛ වේ. මෙම ප්‍රයත්නයන්, මනා ප්‍රාග්ධනයක් සහිත රක්ෂණකරුවන්ගෙන් සහ වෘත්තීයමය අතරමැදියන්ගෙන් සමන්විත, ස්ථාවර මෙන්ම ඔරොත්තු දීමේ හැකියාව සහිත වෙළඳපොළක් සංවර්ධනය කිරීමට දායක වී ඇති අතර ඒ හරහා රක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි මහජන විශ්වාසය තවදුරටත් ශක්තිමත් කර ඇත. 2035 අනාගත දැක්ම දෙස බලන විට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වඩාත් කාර්යක්ෂම සහ දත්ත මත පදනම් වූ නියාමකයෙකු බවට පත්වීමට කැපවී සිටියි. ඩිජිටල් යටිතල පහසුකම්, තත්කාලීන අධීක්ෂණ පද්ධති සහ ස්වයංක්‍රීය අනුකූලතා නිරීක්ෂණ සඳහා සිදුකරන උපායමාර්ගික ආයෝජනයන් මගින් නියාමන කාර්යක්ෂමතාව සහ ප්‍රතිචාරාත්මක බව තවදුරටත් ඉහළ නංවනු ඇත. ඒ අතරම, ආරක්ෂණයේ පවතින පරතරය අවම කිරීම සඳහා ක්ෂුද්‍ර රක්ෂණ සහ සරල කළ රක්ෂණ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇති අතර රක්ෂණය සියලුම ශ්‍රී ලාංකිකයින්ට ප්‍රවේශ විය හැකි සහ දැරිය හැකි මිලකට ලබා ගත හැකි බව සහතික කරනු ඇත.

මෙම සුවිශේෂී සන්ධිස්ථානයේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කැපවූ කාර්යමණ්ඩලය සහ ක්ෂේත්‍රය තුළ අපගේ වටිනා හවුල්කරුවන් වෙත මාගේ අවංක කෘතඥතාව පළ කරමි. ඔවුන්ගේ වෘත්තීයභාවය, ප්‍රවීණතාවය සහ සහයෝගීතාවය අපගේ සාර්ථකත්වයේ වැදගත්ම සාධකය වේ. රක්ෂණ ක්ෂේත්‍රය තවදුරටත් ශක්තිමත් කිරීමටත් ශ්‍රී ලංකාවේ ස්ථාවරත්වය, වර්ධනය සහ සමෘද්ධිය සඳහා දායක වීමටත් අපි එක්ව අඛණ්ඩව කටයුතු කරමු.

දමයන්ති ප්‍රනාන්දු -
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL)



### ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමයේ සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 25 වන සංවත්සරය නිමිත්තෙන් ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය වෙනුවෙන් මගේ අවංක සුභ පැතුම් පිරිනමමි. වසර ගණනාවක් පුරා ස්ථාවර, විනිවිද පෙනෙන හා ඉදිරි දැක්මක් සහිත රක්ෂණ ක්ෂේත්‍රයක් ගොඩනැගීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඉමහත් දායකත්වයක් ලබා දී ඇත. අවදානම් මත පදනම් වූ නියාමනය, ශක්තිමත් පාලන ව්‍යුහයන් සහ පාරිභෝගික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම මත ගොඩනැගුණු රක්ෂණ කර්මාන්තයේ අඛණ්ඩ ප්‍රගතිය, විශ්වාසයනීයත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කර ඇත.

ඩිජිටල් නවෝත්පාදන, දත්ත මත පදනම් වූ පද්ධති සහ වැඩි මහජන දැනුවත්භාවය මඟින් සහාය ලබමින් රක්ෂණ ව්‍යාප්තිය පුළුල් කිරීම පිළිබඳ කොමිෂන් සභවේ අභිලාෂකාමී දැක්ම අපි ඉහළින් අගය කරමු. සියලුම ශ්‍රී ලාංකිකයින්ට රක්ෂණය වඩාත් පහසු සහ ප්‍රවේශය විය හැකි සේවාවක් බවට පත්කිරීමට මෙම ප්‍රයත්නය අතිශයින්ම වැදගත් වනු ඇත.

වඩාත් අන්තර්ග්‍රාහී අනාගතයට සූදානම් රක්ෂණ කර්මාන්තයක් ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමඟ සමීපව කටයුතු කිරීමට කැපවී සිටී.

ලසිත විමලරත්න -
සභාපති, ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය (IASL)



### ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 25 වැනි සංවත්සරය සමරන මේ මොහොතේ ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය වෙනුවෙන් අපි අපගේ උණුසුම් සුබපැතුම් පිරිනමන්නෙමු. මෙම සන්ධිස්ථානය වෘත්තීයභාවය, සහයෝගීතාවය සහ කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා වූ නොසැලෙන කැපවීම පිළිබිඹු කරන අතර එම වටිනාකම් එක්ව බෙදා ගැනීමට සහ ආරක්ෂා කිරීමට හැකි වීම පිළිබඳ අපි ආඩම්බර වන්නෙමු.

ඒන්ස්ලි ජේ. අලස් -
සභාපති, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA)



### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සිය 25 වැනි සංවත්සරය සමරණ මෙම සුවිශේෂී සන්ධිස්ථානය වෙනුවෙන්, ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය උණුසුම් සුබපැතුම් පිරිනමයි. පසුගිය විසිපස් වසරක කාලය පුරා නියාමන විශිෂ්ටත්වය ශක්තිමත් කිරීමට, පාරිභෝගික විශ්වාසය ඉහළ නැංවීමට සහ ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය තුළ තිරසාර සංවර්ධනයක් ඇති කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇත. එහි ස්ථාවර නායකත්වය අපි අගය කරන අතර ක්ෂේත්‍රය පුරා වෘත්තීයභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ සහයෝගීතාවය අපේක්ෂා කරන්නෙමු.

ආචාර්ය සමීර ධර්මසේන -
කවුන්සිලයේ සභාපති, ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII)



### ශ්‍රී ලංකා ආයුගණකවරුන්ගේ සංගමයේ සභාපතිතුමියගේ පණිවිඩය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 25 වැනි සංවත්සරය වෙනුවෙන් ශ්‍රී ලංකා ආයුගණකවරුන්ගේ සංගමය උණුසුම් සුබපැතුම් පිරිනමයි. ස්ථාවර, විනිවිදභාවයෙන් යුත් සහ ශක්තිමත් රක්ෂණ ක්ෂේත්‍රයක් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව දක්වන අඛණ්ඩ කැපවීම අපි අගය කරමු. වෘත්තීය විශිෂ්ටත්වය ඉහළ නැංවීමට සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ඔබගේ අඛණ්ඩ සහයෝගීතාවය අපි අපේක්ෂා කරමු.

තනූජා ක්‍රිෂ්ණරත්න -
සභාපතිනී, ශ්‍රී ලංකා ආයුගණකවරුන්ගේ සංගමය (AASL)

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව,**
11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
දුරකථන : (011) 2396184-9 | ෆැක්ස් : (011) 2396190 | ඊ මේල් : info@ircsl.gov.lk | වෙබ් අඩවිය : www.ircsl.gov.lk